# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

නො. 7,900 — 1932ක්වූ ජනවාරි මස 8 වෙනි දිනවූ සිකුරාදා.


## Part IV.— හතරවෙනි කාණ්ඩය.

### සෞඛ්‍ය නීති.

#### වර්ෂ 1932කේ ශ්‍රීපාද වන්දනා කාලය.

වර්ෂ 1932කේ අවුරුද්දේ වන්දනා කාලය තුළ විෂංගත රෝගය හෝ වෙනත් රෝග වලක්වන පිණිස පණවනලද මෙහි පහත සඳහන්වෙන නියෝග වන්දනාකාරයින් විසින් පිළිපදින්ට ඕනෑය.

වර්ෂ 1932ක්වූ ජනවාරි මස 4වෙනි දින රත්නපුර කච්චේරියේදීය.

සී. එච්. කොලින්ස්,
ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ වම්හ.

1. බීමට සහ නෑම පිසීම පිණිස වතුර ගතයුතු ස්ථාන එකී තැන්වල බෝඩ්ලෑලිවලින් පෙන්නුම්කර ඇත. එකී ස්ථාන අසල වතුර කිසිම කෙනෙක් විසින් මොනම කාරණාවක්නිසාවත් කිළුටුකිරීම තහනම්ය.
2. නාන ස්ථාන සහ වැසිකිළිද එසේම බෝඩ්ලෑලිවලින් පෙන්වා ඇත.
3. අම්බලමක හෝ මඩමක සිට යාර සියයකට නොහොත් බඹ පනහකට මෑත අපිරිසිදුකිරීම හාත්පසින්ම තහනම්ය.
4. අම්බලම්, කඩ සහ නවාතැන්පල් බැලීමට සහ සාමාන්‍යයෙන් පිරිසිදුකම පැවැත්වීමට මුලාදෑනි පත්කර ඇත.
5. යම් අසනීපයක් හැදුන වහාම සනීපාරක්ෂක ඉන්ස්පැක්ටර්තැනට දන්වන්ට ඕනෑය.

---

### ආණ්ඩුවේ ඉඩම් විකිණීම හෝ බදුදීම සඳහා දැන්වීම්.

#### වයඹ දිසාවේ ඉඩම් විකිණීම.

වර්ෂ 1931ක්වූ ඔක්තෝබර් මස 30වෙනි සහ නොවැම්බර් මස 27වෙනි දිනවලත් නිකුත්කරණලද නොම්බර 7,890 සහ 7,895 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රවල පළවූ පරිදි වර්ෂ 1932ක්වූ ජනවාරි මස 18වෙනි අඟහරුවාදා පෙරවරු 10ට පොල්ගහවෙල තානායමේදී පවත්වන්ට නියමව තිබූ ඉඩම් විකිණීම අවලංගුකොට ක්‍රමයෙන් වර්ෂ 1932ක්වූ පෙබරවාරි මස 9වෙනි අඟහරුවාදා පෙරවරු 10ට පොල්ගහවෙල තානායමේදී පවත්වන බව මෙයින් දැනුම්දෙමි.

වර්ෂ 1931ක්වූ දෙසැම්බර් මස 23වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. වී. බ්‍රෙන්,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වම්හ.

---

#### වයඹ දිසාවේ ඉඩම් විකිණීම.

වර්ෂ 1931ක්වූ ඔක්තෝබර් මස 30වෙනි දින නිකුත්කරණලද නොම්බර 7,890 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ පරිදි වර්ෂ 1932ක්වූ ජනවාරි මස 19වෙනි අඟහරුවාදා පෙරවරු 10ට ගිරිඋල්ලේ තානායමේදී පවත්වන්ට නියමව තිබූ ඉඩම් විකිණීම අවලංගුකොට ක්‍රමයෙන් වර්ෂ 1932ක්වූ පෙබරවාරි මස 10වෙනි බදාදා දවල් දහයට ගිරිඋල්ලේ තානායමේදී පවත්වන බව මෙයින් දැනුම්දෙමි.

වර්ෂ 1931ක්වූ දෙසැම්බර් මස 23වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. වී. බ්‍රෙන්,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වම්හ.

### වයඹ දිසාවේ ඉඩම් විකිණීම.

වර්ෂ 1931ක්වූ නොවැම්බර් මස 27වෙනි දින නිකුත්කරණලද නොම්බර 7,895 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ පරිදි 1932ක්වූ ජනවාරි මස 20වෙනි දින පෙරවරු 10ට කුලියාපිටියේ කානාායමේදී පවත්වන්ට නියමව තිබූ ඉඩම් විකිණීම අවලංගුකොට වර්ෂ 1932ක්වූ පෙබරවාරි මස 11වෙනි දින පෙරවරු 10ට කුලියාපිටියේ කානාායමේදී පවත්වන බව මෙයින් දැනුම්දෙමි.

වර්ෂ 1931ක්වූ දෙසැම්බර් මස 23වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. වී. බ්‍රවුන්,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුවට.

---

### වයඹ දිසාවේ ඉඩම් විකිණීම.

වර්ෂ 1931ක්වූ නොවැම්බර් මස 27වෙනි දින නිකුත්කරණලද නොම්බර 7,895 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ පරිදි වර්ෂ 1932ක්වූ ජනවාරි මස 21වෙනි දින පෙරවරු 10ට බින්ගිරියේ කානාායමේදී පවත්වන්ට නියමව තිබූ ඉඩම් විකිණීම අවලංගුකොට වර්ෂ 1932ක්වූ පෙබරවාරි මස 12වෙනි සිකුරාදා පෙරවරු 10ට පවත්වන්ට නියම්කළ බව මෙයින් දැනුම්දෙමි.

වර්ෂ 1931ක්වූ දෙසැම්බර් මස 23වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. වී. බ්‍රවුන්,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුවට.

---

### වයඹ දිසාවේ ඉඩම් විකිණීම.

වර්ෂ 1931ක්වූ ඔක්තෝබර් මස 30වෙනි දින නිකුත්කරණලද නොම්බර 7,890 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ පරිදි වර්ෂ 1932ක්වූ ජනවාරි මස 22වෙනි සිකුරාදා පෙරවරු 10ට බින්ගිරියේ කානාායමේදී පවත්වන්ට නියමව තිබූ ඉඩම් විකිණීම අවලංගුකොට වර්ෂ 1932ක්වූ පෙබරවාරි මස 13වෙනි සෙනසුරාදා දවල් 10ට බින්ගිරියේ කානාායමේදී පවත්වන්ට නියමකරගත් බව මෙයින් දැනුම්දෙමි.

වර්ෂ 1931ක්වූ දෙසැම්බර් මස 23වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. වී. බ්‍රවුන්,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුවට.

---

### ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම.

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්බර 3නේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—පුත්තලම් දිස්ත්‍රික්කයේ කරතිවු සොහොන් වත්තට ගැනීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ සාරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුම්ආණ්ඩුවහන්සේගෙන් නිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියමේ නො. 7,655. ගම—කරතිවු.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | මුනව්පෙයර්වීයඩි තෝට්ටම් | පොල්වත්ත, අවුරුදු 70ක් පමණ වයසැති පොල්ගස් 2ක් තිබේ | ඇස්. ඇම්. ඊ. ඇම්. මොහමදු නෙයිනා මරික්කාර්, යූ. වී. ඇම්. ඔමර්කත්තා මරික්කාර්, ඇස්. ඇම්. ඇන්. සෙවුනා හමීදු උසන් මරික්කාර්, වී. ඇස්. සේගුකන්දු මරික්කාර් සහ වී. ඇස්. මොහමදු ෂරීප් මරික්කාර්, (සියල්ලම කල්පිටියේ පදිංචි) සහ පුත්තලමේ පදිංචි වී. ඇස්. ඇම්. සෙල්ල මරික්කාර් සහ බී. ඇම්. උමදුක්කා මරික්කාර් | 0 0 13·6 |
| 2 | මාඩුව්ඩ්තෝට්ටම් . | පොල්වත්ත, අවුරුද්දක් පමණ වයසැති පොල්පැලයක්ද, තාවකාලික ගෙයක කොටසක්ද, ළිඳක්ද එහි තිබේ | කල්පිටියේ පදිංචි ඇම්. සෙගලාතිබූ මරික්කාර්, වාප්පු මරික්කාර් සහ ඇම්. ඇම්. මොහමදු මරික්කාර් සහ කරතිවේ පදිංචි ඇම්. ජිලානි මරික්කාර් සහ පුත්තලමේ පදිංචි ඇම්. අසනා මරික්කාර් සහ ඇම්. ෂරීප් මරික්කාර් | 0 0 8·2 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදු ජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇතතාවූ සැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1932ක්වූ පෙබරවාරි මස 13වෙනි දින අපරභාග 2ට කතිසමට කරතිවේ ගම්සභා බංගලාවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒව ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි. වර්ෂ 1931ක්වූ දෙසැම්බර් මස 11වෙනි දින නොම්මර 7,897 දරණ ගැසට් පත්‍රයේ ප්‍රසිඩකරණලද, 1931යේ දෙසැම්බර් මස 5වෙනි දින දරණ නොතීසිය මෙයින් අවලංගු කරණලදී.

වර්ෂ 1931ක්වූ දෙසැම්බර් මස 22වෙනි දින පුත්තලම් කච්චේරියේදිය.

වී. කුමාරස්වාමි,
ආණ්ඩුවේ ඒජන්ත වෙනුවට.

---

### ඉඩම් නිරවුල්කිරීම සම්බන්ධ ප්‍රාරම්භ දැන්වීම.

1931යේ ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපණතයි.

නිරවුල්කිරීමේ දැන්වීම නො. 60 (මාතලේ).

මීට යාකර තිබෙන උප ලේඛනයෙහි විස්තරවෙන ඉඩම්වලින් කිසිවක් හෝ ඒ ඉඩම්වල යම්කිසි කොටසක් නොහොත් ප්‍රයෝජනයක් ගැන යම් කෙනෙකුට යම් අයිතිවාසිකමක් ඇත්නම් එය වර්ෂ 1932ක්වූ ජනවාරි මස 8වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළත මෙහි පහත අත්සන්කරන මා වෙත ඉදිරිපත් නොකළොත් එකී ඉඩම රජසන්තක ඉඩම්යැයි 1931යේ ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපණතේ 5 (1) වන වගන්තිය යටතේ ප්‍රකාශකරනුලබන බවද රජසන්තක ඉඩමක් වශයෙන් ගෙන ඒට කටයුතුකරන බවද එකී ආඥාපණතේ 4 වන වගන්තිය යටතේ මෙයින් දැනුම්දෙනු ලැබේ.

සී. ඊ. ජෝන්ස්,
ආණ්ඩුවේ උප ඒජන්ත වෙනුවට, මාතලේ.

වර්ෂ 1931ක්වූ දෙසැම්බර් මස 5වෙනි දින මාතලේ කච්චේරියේදිය.

(a) මෙම ඉඩම් ගැණ වැඩිදුර තොරතුරු මාතලේ උප ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

(b) මෙකී ඉඩම්වලට නොහොත් එයින් එකකටවත් උඩින් යන යම් පාරකට අයිතිකම් කීම, ඒ ඉඩමට නොහොත් ඉඩම්වලට අයිතිකම් කීම හැටියට භාරගනු ලැබේ.

උප ලේඛනය.

මධ්‍යම දිසාවේ මාතලේ දිස්ත්‍රික්කයේ මාතලේ දකුණ කෝරළයේ අස්ගිරිපල්ලේ සියපත්තුවේ සැලගම යන ගමේ පිහිටා තිබෙන මෙහි පහත දක්වන බිම්කට්ටි, එනම් :—

මුල් සිතියමේ නො. 8,642.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 4 | පිටකන්දේමුකලාන .. | .. 19 2 16 |
| 8 | පල්ලේගෙවත්තේහේන, ගන්තොඩහේන, හපුකස්තැන්න සහ පොල්කස්හේන | .. 26 3 0 |
| 10 | ගන්තොඩහේන .. | .. 1 2 2 |
| | | 47 3 18 |

4. කිරි එලදෙනුන්ට හෝ මීදෙනුන්ට තණ කෑමට ඉඩ දියයුතු නොවේ. එසේ තණ කෑමට ඉඩහරිනු ලැබූ සතුන් ඇල්ලීමට බදුදීමනාකාරයාට හෝ එතුමාගෙන් නිසි බලය ලත් අයෙකුට අවසර තිබේ.

5. බදුකාරයා විසින් බදුනත් ඉඩමේ වැට බදින්ට ඕනෑය කියා දිසාපතිතුමා විසින් අණකරන්ට යෙදුනොත් එසේ වැටවල් බදින්ට බදුකාරයා බැඳෙනවා ඇත.

6. බදුකාරයා විසින් ඉඩම පිරිසිදුව සහ හොඳකාර තබාගන්ටත් නාගරික සභාවේ අණපණත්වල හැටියට පිළිපදින්ට සහ එහි නියමවල හැටියට බදු ගෙවන්ටත් ඕනෑය.

7. බදුකාරයාට මාසයකට ප්‍රථම දැනුම්දී දිසාපතිතුමාට හෝ එතුමාගේ බලය යටතේ ක්‍රියාකරණ කොයිම කෙනෙකුට හමුත් ඉඩමේ භුක්තිය වත්දියක් නොගෙවා නැවත භාරගැනීමට කොයිසම්විටකදී හමුත් අයිතිවාසිකම තබාගත්තා ඇත.

8. බස්නාහිර පළාතේ දිසාපතිතුමාගෙන් ලියවිල්ලකින් ලබාගන්නාලද අවසරයක් නැතුව ඉඩමේ බද්ද වෙන කෙනෙකුට පවරන්ටවත් දෙවන බද්දක් දෙන්ටවත් බදුකාරයාට බලය නැත.

9. බද්ද අවසානවන්ට ප්‍රථම මුළු ඉඩම හෝ ඉඩමෙන් යම් කොටසක් ආණ්ඩුවට ඕනෑකළොත් මාසයක් කල්දැන්විට ආපසු භාරදිය යුතුයි. එසේ ආණ්ඩුව විසින් භාරගත්තා මුළු ඉඩමට හෝ ඉඩම් කොටසට ගතවෙන්ට තිබෙන බද්දෙන් ඒ ප්‍රමාණයට ඉදිරියට ගතවෙන්ට තිබෙන කාලයට වැටෙන බදු මුදල ආපසු ගෙවන්ට යෙදෙනවා ඇත.

10. ඉහත සඳහන්වෙන කොන්දේසි කඩකළහොත් වන්දි මුදලක් නොගෙවා බදුකාරයා සහ ඔහුගේ වැඩකරුවන්වත් ඉඩමෙන් අහක්කර ඉඩමේ භුක්තිය නැවත ගැනීමට දිසාපතිතුමාට බලය තිබේ.

11. දිසාපතිතුමාගේ අවසරයක් නොමැතිව කිසිම ගොඩනැගිල්ලක් සාදන්ට බැරිය.

12. ඉඩම පෝරකිරීම සඳහා අමුපෝර හෝ රොඩු පාවිච්චි කිරීමටද, ඉඩම තුළ ඒවා ගබඩාකර තිබීමටද අවසර නැත. පෝර ගබඩාකර තැබීම අවශ්‍යනම් සනීපාරක්ෂක මූලාදැනි තැන නියමකරන ප්‍රකාරයට මැසිබිජ මලපත් තහන්ට ඕනෑය.

13. දිය නලවලින් වතුර පාවිච්චිකිරීමේ පිළිවෙළක් ඇතිකරන්ට ඕනෑය. එසේකළ නොහැකිනම් නිසියාකාර බදින ලද්දාවූ ළිඳක තැන එය මදුරුවන්ගෙන් ආරක්ෂාකර පොම්පයක මාර්ගයෙන් වතුර ගැනීම කරන්ට ඕනෑය.

14. වතුර එක්කාසුවියහැකිවූ දැනට පවතින වලවල් වසන්ට ඕනෑවා සහ වතුර එක්කාසුවියහැකි වළවල් හෝ අගල් අළුතෙන් කැපීමට අවසර නැත.

15. ඉඩමේ වැඩකරන වැඩකරුවන්ට යෝග්‍ය වාසස්ථාන හා නාගරික ඉංජිනේරුතැන සහ සනීපාරක්ෂක වෛද්‍ය නිලධාරිතැන විසින් මනාවයි පිළිගන්නාලද වැසිකිළි පහසුකම් ඇතිකරන්ට ඕනෑය.

16. යම්කිසි ඉල්ලුම්පත්‍රයක් හෝ සියලුම ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේපකිරීමේ බලය දිසාපතිතුමා වෙත තබාගන්ට යෙදුනා ඇත.

ඇම්. ඇම්. වැඩර්බර්න්,
බස්නාහිර පළාතේ දිසාපතිතැන වම්හ.

වෂී 1932ක්වූ ජනවාරි මස 4වෙනි දින
කොළඹ කච්චේරියේදීය.

මේ සඳහන් ඉඩම.

| කච්චිය. | පිහිටීම. | අන්දම. | ප්‍රමාණය, අ. රූ. ප. |
|---|---|---|---|
| 32 | තිඹිරිගස්යාය .. | තණකොළ ඉඩම සහ තණ කෑවීමේ ඉඩම | 7 3 32 |

---

මෙහි පහත සඳහන්කරන ආණ්ඩුවේ ඉඩමේ පිහිටි පොල් ගස් 105කින් ලැබෙන ප්‍රයෝජනයේ බද්ද වෂී 1932ක්වූ පෙබරවාරි මස 1වෙනි දින පටන් අවුරුදු එකකට මෙහි පහත පෙනෙන කොන්දේසිවලට යටත්ව බදුගැනීමට ටැන්ඩර් නොහොත් ඉල්ලුම්පත්‍ර බස්නාහිර දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් භාරගන්නා බව මෙයින් දැනුම්දෙයි.

2. මෙම ටැන්ඩර් නොහොත් ඉල්ලුම්පත්‍ර වෂී 1932ක්වූ ජනවාරි මස 29වෙනි සිකුරාදා පස්වරු 1 වනතුරු කොළඹ කච්චේරියේදී භාරගෙන එදිනදී ඒවා කඩාබලනවා ඇත. ඉල්ලුම්පත්‍ර සැබෑබව ඔප්පුවීමට ඉල්ලුම්කරන්නාවූ සියලු දෙනාම ඒජන්ත උන්නාන්සේ ඉදිරියේ තමන්ම නොහොත් තමන් වෙනුවෙන් ක්‍රියාකරන්නෙක් පෙණීසිටින්ට ඕනෑය.

කොන්දේසි.

1. බද්ද මිලේවගත් අය විසින් බදු මිල සම්පූර්ණයෙන්ම වෙන්දේසි දවසේදීම ගෙවිය යුතුයි.

2. දැනට පවතින යම් වැටක් හෝ මායිමක් වෙනස්කරන්ට වත් යම් ගසක් කපන්ටවත් ගැනුම්කාරයාට හෝ ඔහුගේ වැඩකරුවන්ටත් අවසර නැත.

3. කලවීපොල්, කුරුම්බා යනාදිය ගැනුම්කාරයා විසින් හෝ ඔහුගේ වැඩකරුවන් විසින්වත් කැඩීම තහනම්ය.

4. ඒජන්ත උන්නාන්සේගෙන් කලින් ලියවිල්ලක් පිට අවසර ඇතුව මිස නැත්නම් ඉඩම යම් කෙනෙකුට පවරන්ට වත් නැවත බදුදෙන්ටවත් ගැනුම්කාරයාට අවසර නැත.

5. බදුකාරයා විසින් නාගරික සභාවේ සියලුම වරිපනම් කාසි ගෙවන්ට ඕනෑය.

6. බදුකාරයාට මාසයකට කලින් දැනුම්දී නැවත ඉඩම භාරගන්ට ඒජන්ත උන්නාන්සේට හෝ ඔහුගේ බලය පිට ක්‍රියාකරන්නෙකුට බලය තිබේ.

7. මිලේටගත් අය විසින් ඉඩම පිරිසිදුව හොඳකාර තිබෙන්ට ඕනෑවා සහ නාගරික සභාවේ අණපණත්වලට යටත්ව ක්‍රියාකළ යුතුයි.

8. මෙහි තුළ හරක් තණ කැවීම පිණිස ලිහා ඇරීමට සහ බැඳතියන්ට කොහෙත්ම අවසර නැත.

9. කැපීමට ඕනෑකරණ ගස් සියල්ලම ඒජන්ත උන්නාන්සේට කැප්පවීමට බලය තිබේ. ඒවා වැටෙන මුදල බදුකාරයාට ආපසු දෙනු ලැබේ.

10. ඉහත සඳහන්කරන්ට යෙදුන කොන්දේසි කඩකළොත් වන්දි මුදලක් නොගෙවා ගැනුම්කාරයා ඉඩමෙන් අහක්කර නැවත අයිතිවාසිකම් භාරගැනම ඒජන්ත උන්නාන්සේට බලය තිබේ.

11. යම්කිසි ඉල්ලුම්පත්‍රයක් භාරගන්ට හෝ නොගන්ට ඒජන්ත උන්නාන්සේට බලය තිබේ.

ඉහත සඳහන්කර තිබෙන ඉඩම.

මුලර්ස් පාරේ පිහිටි (මීට ප්‍රථම ගැලවීමේ හමුදාවට බදු දෙනලද වෂී 1893ක්වූ ඔක්තෝබර් මස 10වෙනි දින සහ නොම්බර 531 දරණ බදු ප්ලෑනේ සඳහන්) ආණ්ඩුවේ ඉඩමේ දැනට නොකනනලද ඉතිරි බිම් කොටස.

ඇම්. ඇම්. වැඩර්බන්,
බස්නාහිර පළාතේ ආණ්ඩුවේ ඒජන්තතැන වම්හ.

ෂී 1932ක්වූ ජනවාරි මස 5වෙනි
දින කොළඹ කච්චේරියේදීය.

---

සබරගමු පළාතේ රත්නපුර දිස්ත්‍රික්කුවේ පිහිටි මෙහි පහත සඳහන් රජසන්තක ඉඩම්වල අවුරුද්දක්තුළ මැණික් හෑරීමේ බලය ඉල්ලා එවන්ට යෙදෙන ඉල්ලුම්පත්‍ර සබරගමු පළාතේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් භාරගනු ලැබේ.

2. "Tender for the right to gem" එනම "මැණික් හෑරීමේ බලය ඉල්ළුම්කරන ඉල්ළුම්පත්‍රය" යන වචන ඇන්වීලොප් එකේ මතුපිට ලියනලද මුද්‍රලත් ඉල්ළුම්පත්‍ර වෂී 1932ක්වූ ජනවාරි මස 18වෙනි දින පෙරවරු 10ය වනතුරු භාරගනිමින් කඩාබලනවා ඇත. ඉල්ළුම්කාරයෝ ඉදිරිපිට සිටින්ට ඕනෑය. එසේ නැත්නම් නිසි බලයලත් ඒජන්ත කෙනෙක් හෝ ඒජන්තවරු ලවා ඉල්ළුම්පත්‍ර හරි ඒවා බව ඔප්පුකරවන්ට ඕනෑය.

3. ඉඩම් සම්බන්ධ කොමසාරිස් උන්නාන්සේවෙත ඔප්පු කිරීම පිණිස ඒජන්ත උන්නාන්සේ විසින් තෝරාගන්නාලද ඉල්ළුම්පත්‍ර අයිතිකාරයෝ ඉල්ළුම්පත්‍රවල සඳහන් මුදල් සම්පූර්ණයෙන් එවලේම ගෙවන්ට ඕනෑය. තවද ඉඩම් සම්බන්ධ කොමසාරිස් උන්නාන්සේ විසින් ඉල්ලීම භාරගන්ට යෙදුනොත් කොන්දේසි පිළිපැදීම් ආදිය සඳහා ඔප්පුවකට ඇතුල්වෙන්ට ඕනෑය.

4. යම් ඉල්ලුම්පත්‍රයක් හෝ ඉල්ලුම්පත්‍ර සියල්ලම භාරගනො ගැනීමේද, ඉල්ලුම්පත්‍රයක යම් කොටසක් භාරගැනීමේද බලය සබරගමු පළාතේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ වෙත තබාගන්නාලදී.

5. බාරගන්නාලද ඉල්ලුම්පත්‍ර අයිතිකාරයන් විසින් තම තමන් ඉල්ලුම්කරණලද ඉඩම්වල පතල් ගොඩකිරීමාදියට සහ අවසරපත්‍රයේ කොන්දේසි කඩකිරීම් වැළැක්වීමටත් සබරගමු පලාතේ ඒජන්ත උන්නාන්සේ විසින් නියමකරන්ට යෙදෙනලද රුපියල් සියයකට (රු. 100) වැඩිනොවන මුදලක් එක එක ඉඩමට ඇප වශයෙන් කච්චේරියේ බඳින්ට ඕනෑය.

6. එක එක ඉඩමට වෙන් වෙන් වශයෙන් ඉල්ලුම්පත්‍ර එවන්ට ඕනෑය.

7. ඉඩම් ඉල්ලුම්කාරයෝ තමතමන් ඉල්ලුම්කරණලද ඉඩම්වල වැඩ පටන්ගන්නා දින සහ වැඩ නවත්වන දිනද කොළඹ ලෝහ පරීක්ෂකතැන වෙත දන්විය යුතුයි. තවද එකී ලෝහ පරීක්ෂකතැන පතල් විභාගයට ආවිට සියලුම පතල්වල වැඩ නවත්වා පරීක්ෂාකිරීමට ඉඩදිය යුතුයි.

8. වැඩිදුර කාරණ සබරගමු පලාතේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන් ලබාගත හැකිවේ.

### ඉඩම්වල තොරතුරු.

1. නවදුන්කෝරලේ මූවගම පිහිටි නො. 74 දරන සිතියමේ නො. 2 දරන බිම්කට්ටියෙන් කොටසක් වන අක්කර දෙකක් පමන බිම්තරම ඇති ඇල්ලෙයේගෙදෙල්බවේහේන නොහොත් මිරිස්හේනේමූකලාන, බණ්ඩාරහේනේමූකලාන සහ දික්හේනේමූකලානට මායිම්:—උතුරට, දකුණට සහ නැගෙණහිරටත් නො. 2 දරන බිම්කට්ටියේ ඉතිරිකොටස; බස්නාහිරට: නො. 2½ දරන බිම්කට්ටිය—මලදෙල.

2. නවදුන්කෝරලේ මූවගම පිහිටි නො. 74 දරන සිතියමේ නො. 2½ දරන බිම්කට්ටියේ කොටසක් වන දිගින් දම්වැල් 4ක්ද, පළලින් අඩි 8ක්ද ඇති මලදෙලට මායිම්:—උතුරට නො. 16 දරන බිම්කට්ටිය සහ නො. 2 දරන බිම්කට්ටියේ කොටසක්; නැගෙනහිරට සහ දකුනට නො. 2 දරන බිම්කට්ටිය; බස්නාහිරට: නො. 10 සහ 11 දරන බිම්කට්ටි.

සී. එම්. කොලින්ස්,
සබරගමු පලාතේ මහ ඒජන්ත
උන්නාන්සේ.

වර්ෂ 1931ක්වූ දෙසැම්බර් මස 22වෙනි
දින රත්නපුරේ කච්චේරියේදිය.

---

### රා සහ අරක්කු තැබෑරුම් සම්බන්ධව වර්ෂ 1912හේ අංක 8 දරන ව්‍යවස්ථාව යටතේ දැන්වීම.

### පලාත් කැමැත්ත, 1932–33 කළුතර දිස්ත්‍රික්කය. වාද්දුවේ ඡන්දයගැනීම.

වර්ෂ 1931ක්වූ දෙසැම්බර් මස 18වෙනි දින සහ නො. 7,898 දරන ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ වර්ෂ 1931ක්වූ දෙසැම්බර් මස 15වෙනි දින දරණ, වාද්දුවේ අරක්කු තැබෑරුම නැවත පිහිටුවීමට ඡන්දය ගැනීම පිළිබඳ මගේ දැන්වීමේ ප්‍රකාර ඡන්දය ගැනීමේ දින වර්ෂ 1932ක්වූ ජනවාරි මස 29වෙනි සිකුරාදට කල්දමනලද බැව් මෙයින් දැනුම්දෙමි. ඡන්දය ගන්න වේලාවේද ඡන්දය ගන්න ස්ථානවලද කුමුත්තක් නැත.

ඇල්. ඇල්. හන්වර්,
ආණ්ඩුවේ උප ඒජන්ත වරයා.

වර්ෂ 1932ක්වූ ජනවාරි මස 5වෙනි දින
කළුතර කච්චේරියේදිය.


PRINTED AT THE CEYLON GOVERNMENT PRESS, COLOMBO.